**සමන්තුරෙයි ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමන්තුරෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) ප්‍රාදේශීය සභාව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් නිලධාරීන්ට ගෙවූ වැටුප් හා සහික දීමනා එකතුව රු.4,330,840 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ ගිණුම් වාර්තාවල ගැලපීම් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවැති පාරිභෝගික, විදුලි හා ලිපිද්‍රව්‍ය අතැති තොග රු.838,224 ක් සහ විකුණුම් මධ්‍යස්ථානයේ පැවැති රු.408,500 ක තොග මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වෙන්දේසියේ විකුණනු ලැබූ පරිගනක, යන්ත්‍රෝපකරණ හා පිරියත ඇතුළු අයිතම් 30ක පිරිවය වත්කම්වලින් අඩුකර දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ රු.282,659 ක් වූ රූපවාහනියේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ගිණුම් විෂයන් 07ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ශේෂය සහ ලෙජරය ප්‍රකාරව ශේෂ අතර එකතුව රු.10,148,738ක වෙනසක් පැවැතුණි. | -එම- | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.14,974,592 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,642,420 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාවේ ඇස්තමේන්තු කළ ආදායම් අයකිරීමෙහි පවතින අකාර්යක්ෂමතාව සහ අනාර්ථික වියදම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායමට වඩා වියදම් රු.14,924,592කින් වැඩිවී තිබුණි. එසේම, අදාල වර්ෂයේ ඉපැයූ ආදායමට වඩා ගෙවනු ලැබූ වියදම් රු.20,117,850කින් වැඩි වීම හේතුවෙන් මෙම වියදම් ගෙවා නිරවුල් කිරීමට සභාව පසුගිය වර්ෂයේ ඉතිරි කළ අතැති මුදල් ශේෂ රු.20,358,700ක් වැය කර තිබුණි. | කොවිඩ් - 19 හේතුවෙන් මිල ගණන් වැඩවීමෙන් සිදු වූ අතිරේක වියදම් බව. | ඇස්තමේන්තු කළ ආදායම් අයකිරීමෙහිදී කාර්යක්ෂමව හා වියදම්වල ආර්ථික බව පවත්වා ගත යුතුය. |

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 7,348,748 | 32,474,661 | 9,041,949 | 23,432,712 | 10,610,000 | 26,253,226 | 3,253,226 | 22,883,530 |
| ii. | කුලී | 32,408,746 | 39,182,350 | 31,536,857 | 7,645,492 | 32,067,746 | 35,894,941 | 25,540,605 | 10,354,335 |
| iii. | බලපත්‍ර ගාස්තු | 3,080,000 | 1,941,350 | 1,941,350 | - | 2,050,000 | 1,750,350 | 1,750,350 | - |
| iv. | වෙනත් ආදායම් | 13,706,000 | 3,770,315 | 3,770,315 | - | 14,459,000 | 8,311,463 | 8,311,463 | - |
| | එකතුව | 56,543,494 | 77,368,676 | 46,290,471 | 31,078,204 | 59,186,746 | 72,209,980 | 38,855,644 | 33,237,865 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියලුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 2022 දෙසැම්බර් 31 දින දක්වා හිඟහිටි වරිපනම් හා බදු රු.23,432,712 ක් විය. | වරිපනම් හා බදු අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අයකළ යුතු ආදායම් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**(ආ) කුලී**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අය කළ යුතු මස් කඩ කුලීවලින් රු.2,840,896 ක් අය කර නොතිබුණි. එසේම, 2017 වර්ෂයට පෙර සිට පැවැත එන රු.1,105,120ක් කුලි හිමියන් 12 කගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිවැරදි ශේෂය හඳුනාගෙන කුලී මුදල් අයකිරීමට පියවර ගන්නා බව. | -එම- |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවිය යුතු පොදු වෙළෙඳ පොල බදු කුලී රු.3,518,43 0ක් වූ අතර ඉන් රු.1,017,080 ක් වර්ෂ 05කට අධික කාලයක සිට බදුහිමියෙකුගෙන් අයකළ යුතුව පැවැතුණි. | -එම- | -එම- |

**(ඇ) මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.7,411,812 ක් විය. | ඉදිරි කාලයේදී අයකිරීමට කටයුතු කරන බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ කොවිඩ් - 19 සහ සමාලෝචිත වර්ෂයේ පැවැති ආර්ථික අර්බුදය හේතුවෙන් විවෘත වෙළෙඳ පොල, මස් කඩ සහ කඩකුලී හිඟහිටි ආදායම් රු.9,100,054 ක් කපා හැරීමට සමාලෝචිත වර්ෂයේදී ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ලැබී තිබුණි. එසේ වූවත්, සභාව විසින් රු.3,105,238 ක් පමණක් කපා හැර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හිඟ හිටි කඩ කුලී රු.5,994,816ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය වාර්තාවල මෙම කරුණ ගැලපීම් කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් 2018 සිට 2022 දක්වා කාල පරිච්ඡේදයේ වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකිරීමට ඇස්තමේන්තු කළ කඩකාමර සහ අයකරනු ලැබූ කඩකාමර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර සහා බලප්‍රදේශය | මෙම කාරණාව ඉදිරි කාලයේදි විධිමත් අන්දමින් ක්‍රියාත්මක කරන බව. | සභා බලප්‍රදේශය තුළ පිහිටි කඩකාමරවල තථ්‍ය සංඛ්‍යාව ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තුළ පිහිටි කඩකාමරවල තථ්‍ය සංඛ්‍යාව ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් ඇස්තමේන්තු කළ ආදායම හා අයකළ ආදායම අතර රු.1,588,545ක විචලනයක් පැවැතුණි. | | |
| (ඈ) | 2018 සිට 2022 දක්වා කාල පරිච්ඡේදයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ මුළු නිශ්චල දේපළ ඒකක සංඛ්‍යාව පදනම් කරමින් සභාව විසින් වරිපනම් බදු අයකිරීම් සිදුනොකර ඊට අඩු දේපළ ඒකක මත බදු අයකර තිබුණි. මේ හේතුවෙන් පසුගිය වර්ෂ 05 තුළ සභාවට (ආසන්න වශයෙන්) රු.10,582,996 ක ආදායම් අහිමි වී තිබුණි. | -එම- | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කළ මුළු නිශ්චල දේපළ ඒකක සංඛ්‍යාව පදනම් කරමින් වරිපනම් බදු අයකිරීම් සිදුකිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | සභාව මහජනතාවගෙන් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවාවන් සඳහා එකතු කරනු ලබන ගාස්තු, වර්ෂයකට සමෘද්ධි සහනාධාර ලබන පවුලක් සඳහා රු.360ක් බැගින් පවුල් 1,889 කට සහ සමෘද්ධි සහනාධාර නොලබන පවුලක් සඳහා වර්ෂයකට රු. 600ක් බැගින් පවුල් 2,296ද වශයෙන් දෙවර්ගයක ගාස්තු අයකර තිබුණි. කෙසේ වෙතත්, සභාව විසින් වර්ෂයක් සඳහා අයකරනු ලබන ආදායම සහ ඇස්තමේන්තු ගත ආදායම් අතර රු.1,451,552ක වෙනස්කම් පැවැතුණි. | -එම- | වාර්ෂිකව අයකරනු ලබන ආදායමෙන්, ඇස්තමේන්තු කළ සහ අයකළ ආදායම් අතර වෙනස්කම් සැසඳීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා සභා බලප්‍රදේශවල අයත් ප්‍රතිලාභීන් 849 දෙනෙකු විසින් කැපූ කොන්ක්‍රීට් සහ තාර මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තැන්පතුවක් ලෙස රු. 1,255,000ක් අයකර තිබුණි. එම මාර්ග විගණන දිනය වන විටත්, ප්‍රතිලාභීන් විසින් නැවත පිළිසකර කර තැන්පත් මුදල් ආපසු ගෙවීමට හෝ එම අරමුදලින් සභාව විසින් එම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | කැපූ කොන්ක්‍රීට් සහ තාර මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් සහ සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි එකතුව 52ක වටිනාකම ඇතුළත් ලේඛන සභාව විසින් පවත්වා නොතිබුණි. | වත්කම් ලේඛනගත කිරීමට පියවර ගත් බව. | වත්කම් ලේඛනගත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාව භාවිතා කරනු ලබන වාහන 06ක හිමිකාරිත්වය සභාවේ නමට මාරුකිරීමට විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | හිමිකාරිත්වය සභාවේ නමට මාරු කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් වාහනවල හිමිකාරිත්වය සභාවේ නමට මාරුකිරීමට පියවර ගත යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වෙන්නාල් ගම්මානය - 1 අල් හම්රා - 07 මාර්ගය රු. 942,995ක වියදමින් ප්‍රතිසංස්කරණය කරන ලද නමුත් එය වලවල් සහිත, ගල් හා පස් කඳු වශයෙන් පැවතුණි. එසේම මාර්ගය සමතලා කර දෙපස අයින් බොරළු යොදා සකස් නොකිරීම හේතුවෙන් මෙම මාර්ගය භාවිතා කරන පදිකයන්ට සහ පාසල් සිසුන්ට අනතුරු සිදුවීමේ වැඩි අවදානමක් පැවතුණි. | මුල්‍ය ප්‍රතිපාදන ලැබූ විට මෙම මාර්ගය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරනු ලැබේ. | මුල්‍ය ප්‍රතිපාදන සලසාගෙන මාර්ගය සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගතයුතු වේ. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සඳහා අනුමත කළ සේවක සංඛ්‍යාවේ පවතින අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සභාව විසින් කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාවේ සංශෝධනයක් සිදුකර අවශ්‍ය සේවකයින් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සභාවේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට පුරප්පාඩුව පවතින තනතුරු සඳහා වැඩබලන සේවකයින් 85ක් තාවකාලිකව පත් කර සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.34,137,289ක් වැය කර තිබුණි. | ඉදිරි කාලයේ මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාවේ සංශෝධනයක් සිදු කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | සභාවේ සේවය කර මිය ගිය, විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවීම් වැනි හේතු නිසා සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 18කගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ එකතුව රු.186,601 ක් එම පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකිරීමට කටයුතු කර ඇත. | හිඟණය ශේෂ අය කිරීමට කටයුතු කළයුතු වේ. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතන 26ක කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර අලුත් කිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරිසර බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කරන බව. | පරිසර බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කළ යුතුය. |